නිවේදනයි.

**2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත**

ඉහත පනත යටතේ උසස් අධ්‍යාපන අංශයට අදාල තොරතුරු ලබා ගැනීම සඳහා පහත සඳහන් තොරතුරු නිලධාරියා වෙත RTI01දරණ අයදුම් පත්‍රය මඟින් අයදුම් කළ හැකිය.මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීම අනිවාර්ය නොවේ.

**තොරතුරු නිලධාරියා**

| | | |
|---|---|---|
| නම | - | අනෝජා පී. ගුරුගේ මිය |
| තනතුර | - | අතිරේක ලේකම් (පාලන හා මුදල්) |
| ලිපිනය | - | අධ්‍යාපන,උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය<br>උසස් අධ්‍යාපන අංශය<br>අංක18,වෝඩ් පෙදෙස,<br>කොළඹ 07 |
| සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය | - | 0112688338 |
| විද්‍යුත් තැපැල | - | addsec-admin@mohe.gov.lk |

1. තොරතුරු ලබා ගැනීමට RTI01 අයදුම් පත්‍රය හෝ වාචික ඉල්ලීමක් තොරතුරු නිලධාරියා වෙත ඉදිරිපත් කර එය ලැබුණු බවට ලිපියක් ලබා ගන්න.
2. ඔබේ ඉල්ලීමට අදාල තොරතුරු සැපයිය හැකි ඉක්මනින්,කෙසේ වුවද දින14ක් තුළ දන්වනු ලැබේ.
3. ඉල්ලා සිටින ලද තොරතුරු ඔබට දීමට තීරණය කලහොත් කොමිෂන් සභාව නියම කළ ගාස්තුවක් ගෙවිය යුතු නම් ඔබට එය දන්වා එවනු ඇත.තොරතුරු ලබා ගැනීමට ගෙවීමක් කළ යුතු නම් ඒ ගාස්තු ගෙවීම මත හෝ ගාස්තු ගෙවිය යුතු නොවේ නම් ගාස්තු රහිතව ඔබට දින 14ක් තුළ තොරතුරු ලබා දෙනු ඇත.
4. ගාස්තු ගෙවීමෙන් පසු දින 14ක් තුළ තොරතුරු ලබා දීම අපහසු වේ නම් තොරතුරු නිලධාරියා විසින් එකී කාලය දීර්ඝ කිරීමට අවශ්‍ය හේතු සඳහන් කරමින් දින 21ට නොවැඩි කාලයක් තුළ ඔබ ඉල්ලා සිටි තොරතුරු ඔබට ලබා දෙනු ඇත.
5. තොරතුරු ලබා ගැනීම සඳහා වන ඉල්ලීම යම් පුරවැසියකුගේ ජීවිතය සහ පුද්ගලික නිදහස සම්බන්ධයෙන් වන අවස්ථාවක ඉල්ලීම සඳහා ප්‍රතිචාර දැක්වීම ඉල්ලීම ලැබී පැය 48ක් තුළ සිදු කරනු ඇත.
6. තොරුතුරු ලබා ගලැනීම සඳහා කරන ලද ඉල්ලීමකට අදාලව

    I. තොරතුරු ඉල්ලීම සඳහා කරන ලද යම් ඉල්ලීමක් භාර ගැනීම, ප්‍රතික්ෂේප කිරීම.
    II. පනතේ 05වන වගන්තිය යටතේ ප්‍රදානය කිරීමෙන් මුක්ත කර ඇති තොරුතුරු හේතුවෙන් යම් තොරතුරක් වෙත ප්‍රවේශ වීම සඳහා අවස්ථාව ලබා දීම ප්‍රතික්ෂේප කිරීම.
    III. පනත මඟින් නිශ්චිතවම දක්වා ඇති කාලසීමාවන්ට අනුකුල නොවීම
    IV. සම්පූර්ණ නොවූ,නොමඟ යවන හෝ සාවද්‍ය තොරතුරු ප්‍රදානය කිරීම.
    V. වැඩිපුර ගාස්තු අය කිරීම.
    VI. ඉල්ලා සිටිනු ලබන ආකෘතියෙන් තොරතුරු සැපයීමට තොරතුරු නිලධාරියා විසින් ප්‍රතික්ෂේප කිරීම.
    VII. එම තොරතුරු වෙත එම පුරවැසියා ප්‍රවේශ වීම වැළැක්වීම සඳහා එම තොරතුරු විකෘති කර විනාශ කර හෝ අස්ථාන ගත කර ඇති බවට, තොරතුරු ඉල්ලා සිටිනු ලබන පුරවැසියා හට සාධාරණ හේතු පැවතීම,

නිසා අතෘප්තියට පත් වන්නේ නම් පහත සඳහන් නම් කළ නිලධාරියා වෙත දින 14ක් තුළ අභියාචනයක් ඉදිරිපත් කරන්න.

**නම් කළ නිලධාරියා**

| | | |
|---|---|---|
| නම | - | නාලක කලුවැව මහතා |
| තනතුර | - | ලේකම් |
| ලිපිනය | - | අධ්‍යාපන,උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය<br>උසස් අධ්‍යාපන අංශය<br>අංක18,වෝඩ් පෙදෙස,<br>කොළඹ 07 |
| සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය | - | 0112784811 |
| විද්‍යුත් තැපැල | - | secretary @mohe.gov.lk |

7. මෙම නිවේදනයේ 6 වන වගන්තිය පරිදි අභියාචනයක් ඉදිරිපත් කිරීමේදී පහත දැක්වෙන RTI10 දරණ අයදුම්පත පුරවා ඉදිරිපත් කරන්න. RTI10 දරණ අයදුම්පත පිරවීම අනිවාර්ය නොවේ.තොරතුරු ඉල්ලා සිටින්නාට RTI10 අයදුම්පත්‍රයේ සඳහන් අභියාචනය විභාග කිරීමට අවශ්‍ය මූලික තොරතුරු සඳහන් කරමින් ලිපියක් මඟින් අභියාචනය ඉදිරිපත් කළ හැකිය.